# කමලා හැරිස්ට - ජනපති ධුරය



වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඇමෙරිකා ජනාධිපති ජෝ බයිඩන් රෝහල්ගත කිරීමත් සමඟ උප ජනාධිපතිනි කමලා හැරිස් පැය 1 මිනිත්තු 25 ක කාලයක් සඳහා වැඩබලන ජනාධිපති බවට පත් වූවාය.

කාන්තාවකට ඇමෙරිකන් ජනාධිපති බලතල හිමිවුණු පළමු අවස්ථාව මෙය යැයි එරට මාධ්‍ය වාර්තා පෙන්වා දුන්නේය.

ඇමරිකා ව්‍යස්ථාවට අනුව ජනාධිපතිවරයාට තමන්ගේ රාජකාරී නිසි ලෙස කිරීමට නොහැකි අවස්ථාවක් නිර්මාණය වුවහොත් හෝ ඔහු හදිසියේ මියගියහොත් හෝ ජනාධිපති බලතල පැවරෙන්නේ උප ජනාධිපතිවරයාටය. වර්තමානයේ කමලා හැරිස් උප ජනාධිපති ධුරයට පත් වූ පළමු කාන්තාව ද වෙයි.

පසුගිය 19 වැනිදා ජනාධිපති ජෝ බයිඩන් රෝහල්ගත කෙරුණේ වාර්ෂික වෛද්‍ය පරීක්ෂණය සඳහා ය. ජනාධිපතිවරයාව මෙසේ වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයකට යොමු කර ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පරික්ෂා කිරීම සම්ප්‍රදායයි.

වෛද්‍යවරුන් ජෝ බයිඩන් කොලනොස්කොපි පරීක්ෂණයකට යොමු කළේය. එසේ කිරීමට බයිඩන් නිර්වින්දනය කළ අතර උප ජනාධිපති කමලා හැරිස් ට ජනාධිපති බලතල හිමි වූයේ එම කාලසීමාව තුළදීය.

ජෝ බයිඩන් යනු ඇමරිකන් ජනාධිපති ධුරයට පත් වුණු වයස්ගතම තැනැත්තාය. වෛද්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබුණු පසු ධවල මන්දිර වෛද්‍යවරයා මැදිහත් වී මෙම වාර්තා සියල්ල මාධ්‍ය හමුවේ ප්‍රසිද්ධියට පත් කළේය. ජනාධිපතිවරයාගේ සෞඛ්‍යය ගැන විමසිල්ලෙන් පසුවන ඕනෑම අයකුට අන්තර්ජාලය ඔස්සේ එම සවිස්තරාත්මක වාර්තා කියවා බැලීමට අවස්ථාව ලබාදී ඇත.

බයිඩන් ඔහුගේ වයසට අනුව හොඳ නීරෝගී අයෙකු බවත් රාජකාරි කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට හැකි බවත් වෛද්‍ය නිර්දේශය විය.

පසුගිය කාලයේ බයිඩන් නිතරම උගුර පාදනු මාධ්‍ය හමුවීම් වල දී දකින්නට ලැබුණි. ඊට හේතුව උදරයේ ආම්ලිකතා නිසා බව වෛද්‍ය පරීක්ෂණවලදී තහවුරු විය. ඒ බව තහවුරු වූයේ කොලොනොස්කොපි පරීක්ෂණය හරහා ය.

බයිඩන්ට හෘද රෝගී තත්වයක් නොමැති බවත් ඔහුගේ දත් සම්බන්ධයෙන් හෝ සමේ පිළිකා තත්ත්වයක් සම්බන්ධයෙන් හෝ ගැටලු නොමැති බවත් බයිඩන්ගේ ධවල මන්දිර වෛද්‍යවරයා වන කෙවින් ඕ කොනර් මාධ්‍ය හමුවේ පැහැදිලි කර තිබේ.

වෛද්‍ය පරීක්ෂණය සඳහා බයිඩන් ඇතුළත් කෙරුණේ වොෂින්ටන් අගනුවරට ඔබ්බෙන් පිහිටි වෝල්ටර් රීඩ් වෛද්‍ය මධ්‍යස්ථානයට ය. පරීක්ෂණ සියල්ල අවසන් වීමෙන් පසු දහනම වැනි දා සවස 2.05 ට බයිඩන් රෝහලෙන් පිටත් වුණු බවත් ඔහු ඔහුගේ මැරින් වන් නිල හෙලිකොප්ටරයෙන් යළිත් ධවල මන්දිරයට පැමිණි බවත් ධවල මන්දිරය නිකුත්කළ නිවේදනයක සඳහන් විය.

# බයිඩන්ට සුබ උපන්දිනයක්



ඇමරිකාවේ ජනාධිපති ජෝ බයිඩන් හැත්තෑ නම වැනි උපන්දිනය සමරයි. උපන් දිනය වෙනුවෙන් බයිඩන් බිරිඳ ජීල් ද සමග ඩෙලවෙයාර් ජනපදයේ විල්හමින්ටන් හි පිහිටි ඔවුන්ගේ නිවස බලා ගොස් ඇතැයි ධවල මන්දිරය නිවේදනය කළේය.

බයිඩන් ඇමෙරිකන් ජනාධිපති ධුරයට පත් වූයේ මෙම වසරේ ජනවාරියේ ය. ඇමරිකන් ජනාධිපති ධුරයට පත්වූ වයස්ගතම ජනාධිපතිවරයා බයිඩන් ය. උපන් දිනය වෙනුවෙන් විශේෂ සාද හෝ රැස්වීම් කිසිවක් පැවැත්වූයේ නැතැයිද පැවසේ. මේ අතර බයිඩන් ගේ ඩිමොක්‍රටික් පක්ෂ ප්‍රබලයන් ගෙන් බයිඩන්ට උණුසුම් උපන්දින සුබපැතුම් ලැබුණි. ඒ ට්විටර් පණිවුඩ ලෙස ය. පළමුවෙනි සුභ පැතුම් එක් කිරීමට කටයුතු කළේ උප ජනාධිපතිනිය කමලා හැරිස්ය..

පාර්ලිමේන්තු කතා නායිකා නැන්සි පෙලෝසි, ජනාධිපති බයිඩන්ට සුබපතමින් පලකල ට්විටර් පණිවිඩයේ සඳහන් වී ඇත්තේ බයිඩන් ජනාධිපති ධුරයේ සිටීම ඇමරිකානුවන්ට ආඩම්බර බවත් ජනතාවට ආදරය සැබෑ ඇමරිකන් නායකයකු බවත්ය.

මගේ සොහොයුරාට මගේ මිතුරාට සුභ උපන්දිනයක් යැයි ඇමෙරිකාවේ හිටපු ජනාධිපති බැරැක් ඔබාමා නිකුත්කල ට්විටර් පණිවිඩයේ සඳහන් වේ. ඇමරිකාවේ ජනාධිපති ලෙස බැරක් ඔබාමා ජනාධිපති ධුරය දරන අවධියේ උප ජනාධිපති ලෙස කටයුතු කළේ ජෝ බයිඩන් ය.

ඇමරිකන් මාධ්‍ය වාර්තා කරන්නට වූයේ ජනාධිපති බයිඩන්ට හිමි වුනු හොඳම උපන් දින තෑග්ග ඇමරිකානුවන් වෙනුවෙන් සකස් වූ සමාජ සුබසාධන පනත් කෙටුම්පතට සෙනෙට් මණ්ඩලයේ අනුමැතිය හිමි වීම බවය. බිල්ඩ් බැක් බෙටර් නමින් නම් කළ මෙම සමාජ සුබසාධන පනත් කෙටුම්පතට සෙනෙට් මණ්ඩලයේ අනුමැතිය හිමිවූයේ 19 වැනිදාය.




# ශ්‍රී ලංකාවට විදේශ ණය පියවීමේ හැකියාවක් නෑ....

## Fitch Ratings අනතුරු අඟවයි

ශ්‍රී ලංකාව මේ වනවිට දැවැන්ත විදේශ සංචිත අර්බුදයකට මුහුණ දී සිටින බවත්, 2023 වසර වනවිට එම අර්බුදය තවදුරටත් වර්ධනය විය හැකි බවත් ජාත්‍යන්තර Fitch Ratings ආයතනය පවසනවා. මෙම තත්ත්වය මත ශ්‍රී ලංකාව සිය විදෙස් ණය ගෙවීම පැහැර හැරීමේ සැබෑ හැකියාවක් පවතින බවයි එම ආයතනය අනතුරු අඟවමින් කියා සිටින්නේ.

ශ්‍රී ලංකාව ඇතුළු ලොව රටවල් රැසක් පිළිබඳව ආයෝජකයන් දැනුවත් කිරීම සඳහා නිකුත් කර ඇති What Investors Want to Know: Emerging-Market Sovereigns - 4Q21 නමැති වාර්තාවෙන් මේ බව පැහැදිලි කරයි.

2020 නොවැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා බාහිර මුල්‍ය කටයුතු බිඳවැටෙන සුළු මට්ටමක පැවති බවත් මේ නිසා ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම CCC කාණ්ඩය දක්වා පහත හෙළීමට සිදු වූ බවත් Fitch Ratings පවසනවා. මේ වනවිට ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම තහවුරු වී ඇති බවයි අදාල වාර්තාවේ සඳහන්ව තිබෙන්නේ.

2022 ජනවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 500 ක සහ ජුලි මාසයේදී ඇමරිකානු ඩොලර් බිලියන 01 ක ස්වෛරී බැඳුම්කර ආපසු ගෙවීමට තිබෙන බවත් ඒ අනුව 2023 වසර වනවිට ශ්‍රී ලංකාව සතු විදේශ සංචිත ඩොලර් බිලියන 2.5 ක් දක්වා පහත වැටෙනු ඇති බවත් එම වාර්තාව වැඩිදුරටත් පවසනවා.

අන්තර්ජාතික මුල්‍ය අරමුදල වෙත යාම ශ්‍රී ලංකා රජය දිගින් දිගටම ප්‍රතික්ෂේප කිරීම හමුවේ අනාගතයේදී බරපතල අනතුරකට මුහුණදීමට ශ්‍රී ලංකාවට සිදුවනු ඇති බවද Fitch Ratings සඳහන් කරයි.